ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය
இலங்கை கடற்படை சமூகம
SRI LANKA NAVAL ASSOCIATION

ඔබගේ අංකය. Your No.
මාගේ අංකය. My No. SLNA.6 (SD) I
දිනය. Date. 2026.05.17

**Patron** : **Commander of the Navy (ex–officio)**

Hony. President : Rear Admiral Rohan Amarasinghe, RSP, VSV, USP, psc, MNI (Lond), MNESA Centre (USA), (Retd)
Hony. Vice President : Rear Admiral Jayantha Gamage, RSP, USP, ndu, BA (DS), MSc (MS & NSSS), (Retd)
Hony. Secretary : MCPO AS Kumarapperuma, JP (WI), (Retd)
Hony. Treasurer : MCA (RL) AKR Athukorala, USP, JP, (Retd)

<u>ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සියළුම සාමාජිකයින්ගේ අවධානය සඳහා</u>

## <u>ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින් උදෙසා හඳුන්වාදී ඇති සණස සමූහ ජීවිත රක්ෂණාවරණය පිළිබඳව දැනුවත් කිරීම</u>

යොමුව : 2026 මැයි මස 03 වන දිනැති සමාංක දරන මාගේ ලිපිය.

1. ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින් හට, වඩාත් ඵලදායී ප්‍රතිලාභ ලබාදීමේ අරමුණෙන් Sanasa Life Insurance Company PLC සමාගම සමඟින් එක්වෙමින්, නව රක්ෂණාවරණයක් හඳුන්වාදීමට කටයුතු කරන ලද අතර, යොමු ලිපිය මගින් ඒ පිළිබඳව ඔබව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. මෙම රක්ෂණාවරණය සඳහා සංගමයේ සාමාජික/ සාමාජිකාවන්, ඔවුන්ගේ කාලත්‍රයන්, මියගිය නාවික හමුදා සාමාජිකයින්ගේ කාලත්‍රයන්ට සහ සාමාජිකයාගේ වයස අවුරුදු 21කට වැඩි දරුවන් හට එක්වීමේ පහසුකම් සලසා ඇත. දැනටමත් සැලකිය යුතු සාමාජිකයින් ප්‍රමාණයක් මෙම රක්ෂණාවරණය සමඟින් එක්ව ඇති අතර, ඔවුන් අතරින් හිමිකම් ඉල්ලුම් කරන ලද සියලු සාමාජිකයින් හට නාවික හමුදා සංගමය මැදිහත්වීමෙන් තම හිමිකම් මුදල් ප්‍රමාදයකින් තොරව ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

2. මෙම රක්ෂණාවරණය යටතේ හඳුන්වාදී ඇති වාර්ෂික වාරික මුදල රු.7,000.00 ට වැඩි සියලු සමූහ ජීවිත රක්ෂණ සැලසුම් ලබා ගැනීමට බලාපොරොත්තු වන සාමාජිකයින් හෝ ඔහුගේ පවුලේ සාමාජිකයින් හට තවදුරටත් සහන සැලසීමේ අරමුණින්, ඔබ විසින් ලබා ගන්නා සැලසුමට අනුව සම්පූර්ණ වාර්ෂික වාරිකයෙන් 50% ක් පළමුව ගෙවා රක්ෂණාවරණය ආරම්භ කළ හැකි අතර, ඉතිරි 50% ක හිඟ වාරික මුදල කොටස් 02කින් පළමු මාස 03 අවසන් වීමට පෙර ගෙවීමේ පහසුකම් සලසා ඇති බව සතුටින් දන්වා සිටිමු.

3. තවද, කුමන හෝ හේතුවක් නිසාවෙන් පළමු වාරිකය ගෙවා මුල් මාස තුනක කාලසීමාව තුළ අවසාන වාරිකය හෝ වාරික දෙක නොගෙවන සාමාජිකයෙකු වේ නම් එම සාමාජිකයාගේ හිඟ වාරික මුදල, අදාළ සාමාජිකයා පලමු මාස තුන ඇතුළත ලබා ගන්නා යම් හිමිකම් මුදලක් ඇත්නම් එම හිමිකම් මුදලින් රක්ෂණය ලබා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු හිඟ වාරික මුදල අඩු ඉතිරි මුදල ලබාදීමට කටයුතු කරන අතර, පලමු මාස තුන අවසානයෙන් පසුත් ඉතිරි වාරික මුදල නොගෙවන සාමාජිකයන් මෙම රක්ෂණාවරණයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව අවධාරණය කර සිටිමි.

4. මේ අනුව, රක්ෂණාවරණය ලබා ගැනීමට කැමැත්තෙන් පසුවන සියලු සාමාජිකයින් යොමු ලිපිය මඟින් ඉදිරිපත් කරන ලද සණස සමූහ ජීවිත රක්ෂණයේ ප්‍රතිලාභ ඇතුළත් යෝජනාව අධ්‍යයනය කර, ඊට අදාළ අයදුම්පත සම්පූර්ණ කර පහත සඳහන් ගිණුම වෙත තමා ලබා ගැනීමට බලාපොරොත්තු වන සැලසුමට අදාළ වාරික මුදල් බැර කර, අදාළ මුදල් බැර කළ රිසිට්පතද සමඟින් ගරු සභාපති, ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය, නාවික සංකීර්ණය, වැලිසර, රාගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ 0770294281 යන WhatsApp අංකයට ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

| | | |
|---|---|---|
| ගිණුමේ නම | - | Sri Lanka Naval Association Insurance Fund |
| ගිණුම් අංකය | - | 96293123 |
| බැංකුව සහ ශාඛාව | - | ලංකා බැංකුව, වැලිසර ශාඛාව |

5. මේ පිළිබඳව සියළු සාමාජිකයින් අතර ප්‍රසිද්ධියක් ලබාදීමට කටයුතු කරන මෙන් කරුණාවෙන් දැන්වේ.

රියර් අද්මිරාල් ඒආර් අමරසිංහ, ආර්එස්පී, විඑස්වී, යූඑස්පී, පීඑස්සී, (විශ්‍රාමික)
ගරු සභාපති
ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය

යාකිරීම් : යොමු ලිපිය.

# ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය
# இலங்கை கடற்படை சமூகம
# SRI LANKA NAVAL ASSOCIATION

ඔබගේ අංකය. Your No.

මාගේ අංකය. My No. SLNA.6 (SD) I

දිනය. Date. 2026.05.03

**Patron** : **Commander of the Navy (ex–officio)**

Hony. President : Rear Admiral Rohan Amarasinghe, RSP, VSV, USP, psc, MNI (Lond), MNESA Centre (USA), (Retd)
Hony. Vice President : Rear Admiral Jayantha Gamage, RSP, USP, ndu, BA (DS), MSc (MS & NSSS), (Retd)
Hony. Secretary : MCPO AS Kumarapperuma, JP (WI), (Retd)
Hony. Treasurer : MCA (RL) AKR Athukorala, USP, JP, (Retd)


<u>ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සියළුම සාමාජිකයින්ගේ අවධානය සඳහා</u>

<u>ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින් උදෙසා හඳුන්වාදී ඇති සණස සමූහ ජීවිත රක්ෂණාවරණය පිළිබඳව සහ එහි ගිණුම් විස්තර වෙනස්වීම පිළිබඳව දැනුම්දීම</u>

1. 2025 අප්‍රේල් මස 26 වන දින පැවති වාර්ෂික මහා සභා රැස්වීම සඳහා සහභාගී වූ සාමාජික / සාමාජිකාවන් දැනුවත් කළ පරිදි, ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින් හට, වඩාත් ඵලදායී ප්‍රතිලාභ ලබාදීමේ අරමුණෙන් Sanasa Life Insurance Company PLC සමාගම සමඟින් එක්වෙමින්, නව රක්ෂණාවරණයක් හඳුන්වාදුන් අතර, එමඟින් ලබාගත හැකි ප්‍රතිලාභ පිළිබඳව අවස්ථා කිහිපයකදීම ඔබව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

2. සණස සමූහ ජීවිත රක්ෂණාවරණය ලබාගත් සියලු සාමාජිකයින්ගේ රක්ෂණ කටයුතු, හිමිකම් ලබාදීම ඇතුළු අනෙකුත් සියලු අවශ්‍යතාවයන් නාවික හමුදා සංගමය සම්බන්ධීකරණය වී සිදුකර දෙනු ලබන අතර, මේ වන විට රක්ෂණාවරණය ලබාගත් සාමාජිකයින් විසින් යොමු කරන ලද ඉල්ලීම් අනුව සාමාජිකයා රෝහල් ගතවීමට අදාළ ප්‍රතිලාභ, පවුලේ ළඟම ඥාතියෙකුගේ අභාවයකදී හිමිවන අවමංගල්‍යාධාර ප්‍රතිලාභය මෙන්ම, සාමාජිකයාගේ අභාවයකදී හිමිවන අවමංගල්‍ය ප්‍රතිලාභ වෙනුවෙන් ගෙවිය යුතු හිමිකම් මුදල් කඩිනමින්, අදාළ සාමාජිකයින් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් වෙත ලබාදීමට හැකිවී ඇති බව ඉතා සතුටින් දන්වා සිටිමු.

3. දැනට මෙම රක්ෂණාවරණය ලබාගත් සාමාජිකයින්ට අමතරව, ඒ සඳහා එක්වීමට කැමැත්තක් දක්වන සාමාජික/ සාමාජිකාවන්, ඔවුන්ගේ කාලත්‍රයන්, මියගිය නාවික හමුදා සාමාජිකයින්ගේ කාලත්‍රයන්ට සහ සාමාජිකයාගේ වයස අවුරුදු 21කට වැඩි දරුවන් සඳහා ද පහසුකම් සලසා ඇති අතර, මේ සමඟ ඉදිරිපත් කරනු ලබන සණස සමූහ ජීවිත රක්ෂණයේ ප්‍රතිලාභ ඇතුළත් යෝජනාව අධ්‍යයනය කර, ඊට අදාළ අයදුම්පත, පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කර, අදාළ ලිපි ලේඛනද සමඟින්, ඔබ විසින් ලබා ගැනීමට අපේක්ෂිත රක්ෂණ ක්‍රමයට අදාළ මුදල් බැර කළ රිසිට්පතද සමඟින් ගරු සභාපති, නාවික සංකීර්ණය, වැලිසර, රාගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ 0770294281 යන WhatsApp අංකයට ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

4. තවද, රක්ෂණාවරණය ලබා ගන්නා සාමාජිකයින්ගේ මුදල් බැර කිරීම සඳහා අප සංගමය විසින් පෙර භාවිතා කරන ලද ලංකා බැංකුව, වැලිසර ශාඛාවේ ඉතිරි කිරීමේ ගිණුම වෙනුවට මින් ඉදිරියට පහත සඳහන් ජංගම ගිණුම ආරම්භ කර ඇති අතර, ඉදිරියේදී සියලු රක්ෂණ කටයුතු එම ගිණුම හරහා පමණක් සිදුවන බැවින්, ඉහත තෙවන ඡේදය මඟින් දක්වා ඇති පරිදි රක්ෂණාවරණය ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටින සියළුම සාමාජිකයින්ගේ මුදල් බැරකිරීම් පහත විස්තර සඳහන් ගිණුම වෙත පමණක් සිදුකරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

| | | |
|---|---|---|
| ගිණුමේ නම | - | Sri Lanka Naval Association Insurance Fund |
| ගිණුම් අංකය | - | 96293123 |
| බැංකුව සහ ශාඛාව | - | ලංකා බැංකුව, වැලිසර ශාඛාව |

5. මෙ පිළිබඳව සියළු සාමාජිකයින් අතර ප්‍රසිද්ධියක් ලබාදීමට කටයුතු කරන මෙන් කරුණාවෙන් දැන්වේ.

රියර් අද්මිරාල් ඒආර් අමරසිංහ, ආර්එස්පී, විඑස්වී, යූඑස්පී, පීඑස්සී, (විශ්‍රාමික)
ගරු සභාපති
ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය

යාකිරීම් : 1. රක්ෂණ සමාගම විසින් ඉදිරිපත් කර ඇති 2025 අප්‍රේල් මස 28 වන දිනැති ප්‍රතිලාභ යෝජනා ඇතුළත් ලිපිය.
2. රක්ෂණාවරණය ලබා ගැනීමේ අයදුම්පත.

SANASA LIFE INSURANCE COMPANY PLC
340 2/1, R. A. De Mel Mawatha, Colombo 03.
Tel : 011 200 2021 | Fax : 011 257 4705 | Web : www.sicl.lk | Email : info@sicl.lk

දිනය : 28/04/2025
මිල කැඳවුම් අංකය : 2025/36/1748
රක්ෂිතයාගේ නම : ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය
රක්ෂණ වර්ගය : සමූහ ජීවිත රක්ෂණය

ගරු සභාපතිතුමනි,

අවම ප්‍රතිලාභ සහිත පුද්ගලයන් නගා සිටුවීමේ ලා සණස ව්‍යාපාරයේ නිර්මාතෘ විශ්ව ප්‍රසාදිනී ආචාර්ය පී ඒ කිරිවන්දෙණිය මැතිතුමන්ගේ දර්ශනය අනුව යමින් ඔබගේ සංවිධානයේ දියුණුව සඳහා තම ශ්‍රමය , දැණුම හා කාලය කැප කරමින් සිටින්නාවූ ඔබගේ අමිල සම්පත වන සාමාජිකයන්ගේ හෙට දවස වෙනුවෙන් සහ ඔවුන්ගේ සුභ සාධනය කෙරෙහි උනන්දු වන ඔබගේ අවශ්‍යතාවය තෘප්ත කිරීම වෙනුවෙන් ඔබහට ලබා ගත හැකි ඉහළම සත්කාරය සණස ලයිෆ් සමූහ ජීවිත රක්ෂණාවරණයයි

**<u>සණස ලයිෆ් සමූහ ජීවිත රක්ෂණාවරණයේ ලක්ෂණ:-</u>**

1. සියලුම සාමාජිකයන් සඳහා එක රක්ෂණ ඔප්පුවක් නිකුත් කරනු ලැබේ .
2. සාමාජිකයා යනු නාවික හමුදා සංගමයේ සාමාජිකත්වය දරණ අයෙකු විය යුතුය.
3. වෛද්‍ය පරීක්ෂණ අවශ්‍ය නැත.
4. එක් එක් සාමාජිකයා සඳහා වෙන වෙනම අයැදුම්පත් පිරවීම අනවශ්‍යයයි.
5. රක්ෂණ කාලය වසරකි.
6. ඔප්පුවේ හිමිකාරිත්වය නාවික හමුදා සංගමය නමින්
7. සාමාජිකයා සංගම් සාමාජිකත්වයේ පිහිටා සිටින තාක්කල් 24/7 රක්ෂණ ආවරණය
8. ඔප්පු වසර තුල සැලසුමෙන් සාමාජිකයන් ඉවත් කිරීම හෝ ඇතුලත් කිරීම සඳහා පහසුකම
9. සමූහ ජීවිත රක්ෂණාවරණ සඳහා විශේෂයෙන්ම පුහුණු කල කාර්ය මණ්ඩලයක සහය.

| | ආවරණය | ප්‍රතිලාභය 1 (රු.) | ප්‍රතිලාභය 2 (රු.) | ප්‍රතිලාභය 3 (රු.) | ප්‍රතිලාභය 4 (රු.) |
|---|---|---|---|---|---|
| | ජීවිත ආවරණය (ඕනෑම) | 1,000,000 | 1,000,000 | 1,000,000 | 1,000,000 |
| | හදිසි අනතුරු සඳහා වන ජීවිත ආවරණය | 1,000,000 | 1,000,000 | 1,000,000 | 1,000,000 |
| | පූර්ණ හා සදාකාලික අකර්මන්‍යතාවය (අනතුරු සහ රෝග හේතුවෙන්) | 0 | 0 | 1,000,000 | 1,000,000 |
| | හදිසි අනතුරු හේතුවෙන් වන අර්ධ සදාකාලික අකර්මන්‍යතාවය | 500,000 | 500,000 | 1,000,000 | 1,000,000 |
| | අසාධ්‍ය රෝග සඳහා වන ආවරණය (රෝග 38) | 300,000 | 750,000 | 750,000 | 1,000,000 |
| | රෝහල් ගත වීමේ ප්‍රතිලාභය (වසරකට දින 18) | 0 | 0 | 5,000 | 5,000 |
| | අවමංගල්‍යාධාර ප්‍රතිලාභය - සාමාජිකයා සහ පවුලේ සාමාජිකයන් සඳහා | 30,000 | 50,000 | 50,000 | 50,000 |
| **යෝජනා අංක 1** | **සාමාජිකයකු සඳහා අදාළ වාර්ෂික වාරික මුදල -(වයස 18-75)** | **7,000** | **14,000** | **19,000** | **25,000** |
| **යෝජනා අංක 2** | **සාමාජිකයකු සඳහා අදාළ වාර්ෂික වාරික මුදල -(වයස 76-80)** | **17,500** | **29,500** | **37,000** | **45,000** |

අවම සාමාජිකයන් සංඛ්‍යාව - 1,000

340 2/1, R. A. De Mel Mawatha, Colombo 03.
Tel : 011 200 2021 | Fax : 011 257 4705 | Web : www.sicl.lk | Email : info@sicl.lk

**ජීවිත ආවරණය - ඕනෑම**

සාමාජිකයාගේ ජීවිත හානිය සිදුවුවහොත්, එකඟ වූ ප්‍රතිලාභ මුදල ගෙවනු ලැබේ.

**හදිසි අනතුරු සඳහා වන ජීවිත ආවරණය**

හදිසි අනතුරක් නිසා සාමාජිකයාගේ ජීවිත හානිය සිදුවුවහොත්, එකඟ වූ ප්‍රතිලාභ මුදල ගෙවනු ලැබේ.

**පූර්ණ හා සදාකාලික අකර්මන්‍යතාවය (අනතුරු සහ රෝග හේතුවෙන්)**

හදිසි අනතුරක් සහ අසනීප හේතූන් නිසා සිදුවන පූර්ණ සහ සදාකාලික අකර්මන්‍යතාවයදී එකඟ වූ ප්‍රතිලාභ මුදල ගෙවනු ලැබේ.

**හදිසි අනතුරු හේතුවෙන් වන අර්ධ සදාකාලික අකර්මන්‍යතාවය**

මෙම ප්‍රතිලාභය යටතේ හදිසි අනතුරකදී පමණක් සිදුවන අර්ධ සදාකාලික අකර්මන්‍යතාවයකදී PPD ලැයිස්තුවේ සඳහන් පරිමාණයට අනුව එකඟ වූ සහතික මුදලින් ප්‍රතිශතයක් ගෙවනු ලැබේ.

**බරපතල රෝග සඳහා වන ආවරණය (රෝග 38)**

මෙම ප්‍රතිලාභය යටතේ CIB ලැයිස්තුවේ දක්වා ඇති බරපතල රෝගාබාධවලින් එකක් හඳුනාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස එකඟ වූ ප්‍රතිලාභ මුදල ගෙවනු ලැබේ.

**බරපතල රෝග සඳහා වන ආවරණය යටතේ කොන්දේසි**

- ප්‍රතිලාභය ගෙවිය යුත්තේ එක් රෝගයකට පළමු වරට හෝ සහ පෙන්වා දී ඇති ආකාරයේ ශල්‍යකර්මයකට භාජනය වී ඇති බව ඔප්පු වූ විටය. මෙම ප්‍රතිලාභය මූලික මරණ ප්‍රතිලාභයට අමතර ගෙවීමක් විය යුතුය. හිමිකම ගෙවීමෙන් පසු ආවරණය අවසන් වේ.
- ඇතුළත් වීමේ අවම වයස ඊළඟ උපන්දිනයට අවුරුදු 18ක් වන අතර ඊළඟ උපන්දිනයට උපරිමය අවුරුදු 79කි. (ඇන්ජියෝප්ලාස්ටි හැර)
- ඇන්ජියෝප්ලාස්ටි සඳහා පහත සඳහන් කොන්දේසි අදාළ වේ
  - ඇතුල්වීමේ උපරිම වයස අවුරුදු 55 කි.
  - පොරොත්තු කාලය දින 180 කි. මෙම පොරොත්තු කාලය රක්ෂණ වරය ආරම්භ වූ දින සිට හෝ රක්ෂිතයා රක්ෂණ වරයට ඇතුලත් කල දින සිට අදාළ වේ
  - ඕනෑම ඇන්ජියෝප්ලාස්ටි හිමිකම් පෑමකට ගෙවිය යුතු සම්පූර්ණ මුදල බරපතල රෝග ආවරණ මුදලින් 50% ක ප්‍රතිශතයක් වේ. එමෙන්ම එම 50% ප්‍රතිශතයේ මුදල් අගය රුපියල් 1,000,000.00ක උපරිමයකටද යටත්වේ.
- බරපතළ රෝග ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා, රක්ෂිතයා බරපතල රෝගාබාධයක් සිදු වූ දින සිට හෝ අදාළ ශල්‍යකර්මය සිදුකල දින සිට දින 30 ක් ජීවත් විය යුතුය. එම දින 30ක කාලසීමාව තුළ සිදුවන මරණයකදී මරණ ප්‍රතිලාභය පමණක් ගෙවනු ලැබේ. එසේ නොමැතිව දින 30ක කාල සිමාවෙන් පසුව සිදුවන මරණයකදී, බරපතල රෝග සඳහා වන ප්‍රතිලාභය සහ මූලික මරණ ප්‍රතිලාභය යන දෙකම ගෙවනු ලැබේ.
- කිසිම අවස්ථාවක බරපතල රෝග ප්‍රතිලාභය, මූලික ජීවිත ආවරණය ඉක්මවා නොයා යුතුය.
- ඇන්ජියෝප්ලස්ටි හැර අනිකුත් බරපතළ රෝග සඳහා පොරොත්තු කාලය දින 90 ක් වන අතර එම පොරොත්තු කාලය රක්ෂණ වරය ආරම්භ වූ දින සිට හෝ රක්ෂිතයා රක්ෂණ වරයට ඇතුලත් කල දින සිට අදාළ වේ
- බැහැර කිරීම්: පෙර පැවති රෝග , සංජානනීය රෝගී තත්වයන් සහ රක්ෂණ වරයේ සඳහන් වෙනත් කොන්දේසි.

**රෝහල් ගත වීමේ ප්‍රතිලාභය (වසරකට දින 18)**

- මෙම ප්‍රතිලාභය යටතේ ප්‍රකාශිත දෛනික ප්‍රතිලාභ මුදල සපයයි, රක්ෂිතයා රෝහල්ගත වුවහොත්, දිනකට අදාල මුදල ගෙවනු ලැබේ. දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ගතහොත් දෛනික ප්‍රතිලාභය දෙගුණයක් වේ.
- රෝහල්ගත වීමේ ප්‍රතිලාභය ලබා ගත හැකි කාලසීමාව වසරකට උපරිම දින 18කි.
- රෝහල් ගතවීම දින දෙකකට අඩු නම් කිසිදු ගෙවීමක් නොගෙවිය යුතු අතර රෝහල්ගත වීමේ කාලය දින තුනක් හෝ ඊට වැඩි නම්, පළමු දින දෙක ඇතුළුව රෝහල් ගතවී සිටි සම්පූර්ණ දින ගණනට අදාළ හිමිකම් මුදල ගෙවිය යුතු වේ.

- රෝහල් ගතවීම එකදිගට දින 14ක කාලයට වඩා වැඩිනම් ඒ පිළිබඳව රක්ෂණ සමාගම දැනුවත් කොට ඒ සඳහා සමාගමේ අනුමැතිය ලබා ගත යුතුවේ.
- පොරොත්තු කාලය: දින 90 ක් වන අතර එම පොරොත්තු කාලය රක්ෂණ වරය ආරම්භ වූ දින සිට හෝ රක්ෂිතයා රක්ෂණ වරයට ඇතුලත් කල දින සිට අදාළ වේ.(අනතුරක් හේතුවෙන් රෝහල් ගතවිමකදී අදාළ නොවේ).
- ප්‍රතිලාභය ගෙවීමට පෙර සමාගම විසින් නියමාකාරයෙන් පත් කරන ලද වෛද්‍යවරයෙකු ලවා රක්ෂිතයා පරීක්ෂා කරවා ගැනීමට සමාගමට අයිතියක් ඇත.

**<u>අවමංගල්‍යාධාර ප්‍රතිලාභය</u>**

මරණ ලියාපදිංචි කිරීමේ ලේඛනය හෝ රජයේ නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද පිළිගත හැකි හා ශ්‍රී ලංකා නීතිය ඉදිරියේ වලංගු මරණ සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් පසු, ප්‍රතිලාභය යටතේ ඇති මුදල ගෙවනු ලැබේ.

**<u>පවුලේ සාමාජිකයන් සඳහා අවමංගල්‍යාධාර ප්‍රතිලාභය ගෙවීමේදී පහත කරුණු සලකා බැලේ.</u>**

- කලත්‍රයා, දෙමව්පියන් සහ කලත්‍රයාගේ දෙමාපියන් සඳහා උපරිම වයස් සීමාව වයස අවුරුදු 18-80 දක්වා පමණි.
- දරුවන් සහ සහෝදර සහෝදරියන් අවිවාහක සහ විරැකියාවෙන් යුතු විය යුතු අතර ඔවුන් සඳහා අවමංගල්‍යාධාර ප්‍රතිලාභය ලබා දීම වයස අවුරුදු 1 සහ 21 දක්වා පමණි.
- සාමාජිකයා, කලත්‍රයා සමග නීත්‍යානුකූලව විවාහ වී සිටිය යුතුය.
- සේවකයාගේ දෙමාපියන් හා කලත්‍රයාගේ දෙමාපියන් පිළිවෙලින් එම සේවකයාගේ සහ කලත්‍රයාගේ නීත්‍යානුකූල දෙමාපියන් විය යුතුය.
- දරුවන් සේවකයාගේ නීත්‍යානුකූල දරුවන් විය යුතුය.
- සහෝදර සහෝදරියන් සේවකයාගේ නීත්‍යානුකූල සහෝදර සහෝදරියන් විය යුතුය.
- රක්ෂණ වසරක් තුල එක් සාමාජිකයෙකු සඳහා ලබා ගත හැකි උපරිම අවමංගල්‍යාධාර ප්‍රතිලාභ සංඛ්‍යාව රක්ෂිතයාගේ හිමිකමද ඇතුළුව 4 කි

**<u>සාමාන්‍ය විස්තර</u>**

1. රක්ෂණ වරය ආරම්භ කරනවිට යහපත් සෞඛ්‍ය තත්වයෙන් සිටින්නාවූද එදිනෙදා සාමාන්‍ය ජන ජීවිතයේ තම කටයුතු තනිවම කරගන්නාවූද අංගවිකලතත්වයක් හෝ අසාමාන්‍ය ශාරීරික හෝ මානසික තත්වයකින් නොපෙලෙන්නාවූද වුවන් විය යුතුය.
2. අවම සාමාජික සංඛ්‍යාව 1,000ක් විය යුතුය
3. පවුලේ සාමාජිකයන් යන්න පහත ආකාරයට සැලකේ.
   a. අවිවාහක සාමාජිකයා - සාමාජිකයා, සාමාජිකයාගේ දෙමාපියන් සහ සාමාජිකයාගේ සහෝදර සහෝදරියන්
   b. විවාහක සාමාජිකයා - සාමාජිකයා, සාමාජිකයාගේ දෙමාපියන්, කලත්‍රයා, කලත්‍රයාගේ දෙමාපියන් සහ දරුවන්
4. සාමාජිකයා සඳහා ඇතුලත් වීමේ අවම වයස (ඊලග උපන්දිනයට)

| යෝජනා අංක 1 | ප්‍රතිලාභ | BSA/FEB | ADB /TPD / PPD / CIB/HB |
|---|---|---|---|
| | ඇතුලත් වීමේ අවම වයස - අවුරුදු | 18 | 18 |
| | ඇතුලත් වීමේ උපරිම වයස -අවුරුදු | 74 | 74 |
| | ආවරණය අවලංගු වන විට වයස -අවුරුදු | 75 | 75 |

| යෝජනා අංක 2 | ප්‍රතිලාභ | BSA/FEB | ADB /TPD / PPD / CIB/HB |
|---|---|---|---|
| | ඇතුලත් වීමේ අවම වයස - අවුරුදු | 75 | 75 |
| | ඇතුලත් වීමේ උපරිම වයස -අවුරුදු | 79 | 79 |
| | ආවරණය අවලංගු වන විට වයස -අවුරුදු | 80 | 80 |

5. අදාළ වාරිකය වෙනම ගෙවීමෙන් කලත්‍රයා හටද මෙම ආවරණය ලබා ගත හැකිය.
6. හදිසි අනතුරකින් සිදුවන ජීවිත හානියකදී මිලියන 2ක උපරිම මුදලක් ගෙවනු ලැබේ.
7. සාමාජිකයන්ගේ නම්, උපන් දින, සාමාජික අංක, හැඳුනුම්පත් අංක, පුද්ගලික ලිපිනයන්, දුරකථන අංක ලැයිස්තු සමාගම වෙත ලබා දිය යුතුය.
8. සාමාජිකයන් සඳහා වර්ෂයකට අදාළ වාරික මුදල එකවර ගෙවිය යුතුය.
9. සමූහ ජීවිත රක්ෂණ අයදුම් පත්‍රය අනුව මූලික රක්ෂණ ඔප්පුවක් නිකුත් කරනු ඇත

## රක්ෂණ වරය ආරම්භ කිරීම සඳහා මූලික අවශ්‍යතා

1. සමිතිය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කරන ලද පිටපතක් හෝ සමිති ව්‍යවස්ථාවේ පිටපතක්
2. නිවැරදිව පුරවන ලද යෝජනා පත්‍රය
3. සාමාජික තොරතුරු සහිතව නිවැරදි ආකාරයට පුරවන ලද සාමාජික තොරතුරු පත්‍රය
4. අදාළ කාල සීමාව සඳහා වන වාර්ෂික වාරික මුදල
5. නිවැරදිව පුරවන ලද KYC පෝරමය
6. සමිති බැංකු ගිණුමේ පිටපතක්
7. රක්ෂණ ඔප්පුව ලබාගැනීමට අවසර දී ඇති අධ්‍යක්ෂ / කමිටු මණ්ඩල යෝජනාවේ පිටපත
8. තීරණ ගැනීමේ බලය ඇටෝර්නි බලපත්‍රයක් මගින් ලබාදී ඇත්නම් එහි පිටපත

## පොදු කොන්දේසි

1. මෙම රක්ෂණ ආවරණය අනිවාර්ය පදනම මත නිකුත් කරනු ලබන්නකි. මූලික අවශ්‍යතා සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ආවරණය ලබා දීම සණස ලයිෆ් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
2. මෙම රක්ෂණ ආවරණය සමූහ ජීවිත රක්ෂණාවරණයක් වන අතර වාරික වාර්ෂිකව අලුත් කිරීමේ පදනම මත ක්‍රියාත්මක වේ. ආරම්භයේ සිටම ඕනෑම නව අයදුම්කරුවෙකු සඳහා හෝ එදිනට ඇති හිමිකම් අත්දැකීම් මත පදනම්ව ඊලග ආවරණ සංවත්සරයේ සිට දැනට සිටින ඕනෑම අයදුම්කරුවෙකු සඳහා වාරික සංශෝධනය කිරීමට සණස ලයිෆ් හට අයිතිය ඇත.
3. හදිසි අනතුරු අවස්ථාවකදී හැර වෙනත් හේතූන් මත උද්ගතවිය හැකි රෝහල් ගත කිරීමේ වියදම් සහ අනිකුත් ආවරණයන් වෙත හිමිකම් පෑම සඳහා දින 90ක පොරොත්තු කාලසීමාව අවසන් වී තිබිය යුතුය. ඇන්ජියෝප්ලාස්ටි සඳහා පොරොත්තු කාලසීමාව දින 180 කි.
4. මරණ හිමිකම සඳහා අදාළ සිදුවීම වූ දිනයේ සිට දින 30 ක් තුළ සමාගම වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.
5. මරණය නිසා හිමිකමක් ගෙවූ පසු අදාළ සාමාජිකයා රක්ෂණාවරණයෙන් ඉවත් කරනු ලැබේ.
6. රක්ෂණාවරණය පටන් ගන්නා දිනයේ සිට අවුරුද්දක කාලයක් සඳහා රක්ෂණාවරණය බල ගන්වනු ඇත.
7. ශ්‍රී ලංකාව තුල භූගෝලීය සීමාවන්ට පමණක් අදාළ වේ.
8. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ නීතිවලට අනුකූලව පාලනය වන අතර ඒ අනුව අර්ථ නිරූපණය කල යුතුය.

## හිමිකම් ඉල්ලීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා:

1. හිමිකම් පෝරමය
2. හැඳුනුම්පත් - අනන්‍යතාව තහවුරු කිරීම
3. සාමාජිකයාගේ වයස සනාථ කිරීම
4. මරණ සහතිකය (මරණ හිමිකමක් සඳහා)
5. අදාළ පොලිස් වාර්තා (හදිසි අනතුරු මරණයක දී)
6. සමාගම මගින් අවස්ථානුකූලව හිමිකමට අදාලව විමසනු ලබන වෙනත් ලියකියවිලි
7. රෝහල් ගතවීමකදී අදාල වෛද්‍ය තහවුරු කිරීම් සමග සියලු වෛද්‍ය වාර්තා

340 2/1, R. A. De Mel Mawatha, Colombo 03.
**Tel :** 011 200 2021 | **Fax :** 011 257 4705 | **Web :** www.sicl.lk | **Email :** info@sicl.lk

## <u>හිමිකම් ලබාදීම ප්‍රතික්ෂේප කරන අවස්ථා:</u>

1. නීති විරෝධී ක්‍රියාවන් හේතුවෙන් ඉදිරිපත් වන හිමිකම්
2. පියවි සිහිය සහිතව හෝ රහිතව තමන් විසින් සිදුකරගන්නා හානි හේතුවෙන් ඉදිරිපත් වන හිමිකම්
3. පියවි සිහිය සහිතව හෝ රහිතව සිදුකරගන්නා සියදිවි හානි කරගැනීම්
4. රක්ෂණ ඔප්පුවේ ආරම්භක දිනයට පෙර තිබූ සහ දීර්ඝ කාලිනව පැවතෙන බෝනොවන රෝග කාණ්ඩයට අයත් වන රෝගාබාධ, අකර්මන්‍යතා හෝ වෙනත් අසාමාන්‍යතා,විකෘතිතත්වයන් සඳහා ඉදිරිපත් කෙරෙන කවර හෝ හිමිකමක්.

මෙම මිල කැඳවීම සඳහා වලංගු කාලසීමාව නිකුත් කල දින සිට දින 30 කි.

සණස ලයිෆ් වෙත පිවිසීම ගැන ඔබට ස්තුතියි

ස්තුතියි
මෙයට විශ්වාසී

.................................
මහේෂ් පල්ලියගුරු
බලයලත් නිලධාරී - ජීවිත රක්ෂණ

**PARTIAL AND PERMANENT DISABILITIES (PPD) LIST**

| | | | |
|---|---|---|---|
| 1. Loss of sight of one eye | 50% | 14. Loss of middle finger (two phalanges) | 4% |
| 2. Deafness of both ears | 50% | 15. loss of one phalange in the middle finger | 2% |
| 3. Deafness of one ear | 25% | 16. Loss of ring finger (three phalanges) | 10% |
| 4. Loss of speech | 50% | 17. Loss of ring finger (two phalanges) | 4% |
| 5. Loss of a limb at or above wrist or ankle | 50% | 18. Loss of one phalange in the ring finger | 2% |
| 6. Loss of thumb and four fingers | 50% | 19. Loss of little Finger (three phalanges) | 5% |
| 7. Loss of four fingers in one arm | 35% | 20. Loss of little Finger (two phalanges) | 3% |
| 8. Loss of thumb (both phalanges) | 15% | 21. Loss of one phalange in the little finger | 2% |
| 9. Loss of one phalange in the thumb | 10% | 22. Loss of all toes of one foot | 17% |
| 10. Loss of index finger (three phalanges) | 10% | 23. Loss of big toe (Two phalanges) | 5% |
| 11. Loss of index finger (Two phalange) | 8% | 24. Loss of big toe (one phalanges) | 2% |
| 12. Loss of index finger (one phalange) | 4% | 25. Loss of any other toe | 3% |
| 13. Loss of middle finger (three phalanges) | 10% | | |

**CRITICAL ILLNESSES (CIB) LIST**

| | | | |
|---|---|---|---|
| 1 | Cancer | 20 | Chronic Lung Disease |
| 2 | Myocardial Infarction | 21 | Coma |
| 3 | Stroke | 22 | Deafness |
| 4 | Coronary Artery Surgery | 23 | Fulminant Viral Hepatitis |
| 5 | Renal Failure | 24 | Major Head Trauma |
| 6 | Major Organ Trans plant | 25 | Loss of Speech |
| 7 | Paralysis | 26 | Major Burns |
| 8 | Blindness | 27 | Medullary Cystic Disease |
| 9 | Heart Valve Surgery | 28 | Motor Neurone Disease |
| 10 | Surgery for a Disease of the Aorta | 29 | Bacterial Meningitis |
| 11 | Multiple Sclerosis | 30 | Muscular Dystrophy |
| 12 | Alzheimer's Disease (before 65 birthday) | 31 | Pulmonary Arterial Hypertension |
| 13 | Amyotrophic Lateral Sclerosis | 32 | Parkinson's Disease (before 65 birthday) |
| 14 | Angioplasty | 33 | Poliomyelitis |
| 15 | Apallic Syndrome | 34 | Scleroderma |
| 16 | Aplastic Aneamia | 35 | Systemic Lupus Erythematosus |
| 17 | Benign Brain Tumor | 36 | Loss of Independent Existence (before 65 birthday) |
| 18 | Cardiomyopathy | 37 | Chronic Relapsing Pancreatitis |
| 19 | Chronic Liver Disease | 38 | Severe Rheumatic Arthritis |

SANASA LIFE INSURANCE COMPANY PLC
340 2/1, R. A. De Mel Mawatha, Colombo 03.
Tel : 011 200 2021 | Fax : 011 257 4705 | Web : www.sicl.lk | Email : info@sicl.lk

16 ජුලි 2025

ගරු සභාපති
ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය
වැලිසර
රාගම.

ගරු මහත්මයාණෙනි,

**<u>ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයන්ගේ කලත්‍රයා සහ දරුවන් සමූහ ජීවිත රක්ෂණය යටතේ ආවරණය කිරීම.</u>**

උක්ත කරුණ යටතේ ඔබ සමඟ 01 ජුලි 2025 වැනිදා අප, ඔබ මුලස්ථානයේදී කරන ලද සාකච්ඡාව හා බැදේ.

ඉහත කාණ්ඩයට අයත් වන නාවික නිලධාරියා මියගිය කලත්‍රයන් සහ නාවික හමුදා සාමාජිකයාගේ වයස අවුරුදු 21ට වැඩි දරුවන් සඳහාද අදාළ වාර්ෂික වාරිකය ගෙවීමෙන් පසුව ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයට ලබා දුන් සමූහ ජීවිත රක්ෂණය යටතේම ආවරණය කිරීමට හැකියාව ඇති බව සතුටින් යුතුව දැනුම් දෙමු.

එම කලත්‍රයන්ගේ සහ දරුවන්ගේ තොරතුරුද ඔබ සංගමයේ සාමාජිකයන්ගේ තොරතුරු ලබා දෙන ආකාරයටම ලබා දිය හැකි බවද තවදුරටත් දන්වා සිටිමු.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍යනම් අපගේ නියෝජ්‍ය නාලිකා ප්‍රධානි දුෂාන්ති හපුගොඩ මහත්මිය (දුරකථන අංක 076-3119226) විමසන මෙන්ද කාරුණිකව දන්වා සිටිමු.

ස්තූතියි,

මෙයට විශ්වාසී,

මහේෂ් පල්ලියගුරු
ප්‍රධානී ප්‍රාරක්ෂණ - සමූහ ජීවිත

**SANASA LIFE INSURANCE COMPANY PLC රක්ෂණ ආයතනය මඟින් හඳුන්වා දෙනු ලබන 'සණස සමූහ ජීවිත රක්ෂණය'' ලබා ගැනීම සඳහා කැමැත්තක් දක්වන ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින්ගේ අයදුම්පත**

1. සාමාජිකයාගේ/කලාත්‍රයාගේ/ දරුවාගේ සම්පූර්ණ නම : ..............................................................................

..........................................................................................................................................

2. සාමාජිකයාගේ/කලාත්‍රයාගේ / දරුවාගේ මුලකුරු සමඟ නම : ..............................................................................

3. නිලය / තරාතිරම : ..............................................................................

4. ජාතික හැඳුනුම්පත් අංකය : .............................................................................. (පිටපතක් අමුණන්න)

5. උපන් දිනය : ..............................................................................

6. වයස (2025 ජුනි 01 වන දිනට) : අවු: ............ මාස : ......... දින : ............

7. සාමාජික අංකය : SLN/....................

8. ලිපිනය : ..........................................................................................................................

9. දුරකථන අංකය : ........................................... වට්ස්ඇප් අංකය : ..................................................

10. රක්ෂිතයාගේ ජීවිත හානියකදී, මරණ හිමිකම හිමිගැන්වීමට නම්කල පුද්ගලයාගේ :

අ. සම්පූර්ණ නම : ..........................................................................................................

ආ. ජාතික හැඳුනුම්පත් අංකය : .............................................................. (පිටපතක් අමුණන්න)

ඇ. ඥාති සම්බන්ධතාවය : ...............................................................

11. පවුලේ සාමාජිකයෙකුගේ මරණයකදී අවමංගල්‍යාධාර දීමනාව ලබාදීම සඳහා :

| | | |
|---|---|---|
| රක්ෂිතයාගේ මවගේ | සම්පූර්ණ නම | |
| | ජාතික හැඳුනුම්පත් අංකය | |
| | උපන් දිනය | |
| රක්ෂිතයාගේ පියාගේ | සම්පූර්ණ නම | |
| | ජාතික හැඳුනුම්පත් අංකය | |
| | උපන් දිනය | |
| කලාත්‍රයාගේ මවගේ | සම්පූර්ණ නම | |
| | ජාතික හැඳුනුම්පත් අංකය | |
| | උපන් දිනය | |
| කලාත්‍රයාගේ පියාගේ | සම්පූර්ණ නම | |
| | ජාතික හැඳුනුම්පත් අංකය | |
| | උපන් දිනය | |
| අවුරුදු 21 ට අඩු අවිවාහක දරුවන්/සහෝදරයින් | | |
| දරුවා/සහෝදරයා 1 | සම්පූර්ණ නම | |
| | ජාතික හැඳුනුම්පත් අංකය | |
| | උපන් දිනය | |
| දරුවා/සහෝදරයා 2 | සම්පූර්ණ නම | |
| | ජාතික හැඳුනුම්පත් අංකය | |
| | උපන් දිනය | |
| දරුවා/සහෝදරයා 3 | සම්පූර්ණ නම | |
| | ජාතික හැඳුනුම්පත් අංකය | |
| | උපන් දිනය | |

12. ලබා ගැනීමට බලාපොරොත්තුවන රක්ෂණ යෝජනා ක්‍රමය ඉදිරියෙන් **X** ලකුණ යොදන්න.

| | ප්‍රතිලාභය 1 | ප්‍රතිලාභය 2 | ප්‍රතිලාභය 3 | ප්‍රතිලාභය 4 |
|---|---|---|---|---|
| යෝජනා අංක 1 (වයස අවු.18-75) | 7,000/= ☐ | 14,000/= ☐ | 19,000/= ☐ | 25,000/= ☐ |
| යෝජනා අංක 2 (වයස අවු.76-80) | 17,500/= ☐ | 29,500/= ☐ | 37,000/= ☐ | 45,000/= ☐ |

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනීම පරිදි සත්‍ය හා නිවැරදි බවට සනාථ කෙරෙන අතර, 2025 අප්‍රේල් මස 28 වන දින ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ ආයතනය වෙතින් ඉදිරිපත් කර ඇති අංක 2025/36/1748 දරණ සමූහ ජීවිත රක්ෂණ යෝජනාවේ සඳහන් අදාල කරුණු සහ කොන්දේසි වලට යටත්ව, රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ලබා ගැනීමට එකඟ වන බව සහතික කරමි .

දිනය : .....................................

.....................................................

අයදුම්කරුගේ අත්සන